# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2083/16 – 2018 අගෝස්තු 09 වැනි බ්‍රහස්පතින්දා – 2018.08.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/COM/04/2016/149.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත 4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.04.09 වැනි දින අංක 2066/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2018.04.04 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. නිමල් මයා, ආර්. ජී. 4, සොයිසා පුර, මොරටුව

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, කොළඹ 02.

අතර පවත්නා 2018.03.23 වැනි දින කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නන්දසේන බැදිගම මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2018.04.04 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 24 වැනි දින,
කොළඹ දී ය.

08 - 805/1

---

මගේ අංකය : IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. නිමල් මයා, ආර්. ජී. 4, සොයිසා පුර, මොරටුව

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, ඕබඩගේ ලීලාරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවීන්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එච්. කේ. නිමල් මයා, ආර්. ජී. 4, සොයිසා පුර, මොරටුව

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, අංක 130, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"1981 වර්ෂයේ ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ පරිගණක ක්‍රියාකරුවකු ලෙස සේවයට බැඳී, දැනට ක්‍රම සහකාර ලෙස සේවය කරන එච්. කේ. නිමල් මයාට 1996 වර්ෂයේ සිට ක්‍රම විග්‍රාහක තනතුර හා හිඟ වැටුප් ලබා නොදීමෙන් හා 2006.01.01 දින සිට ඉටු කරනු ලැබූ දත්ත සුපරීක්ෂක කටයුතු වෙනුවෙන් එම තනතුරේ වැඩ බැලීමේ දීමනාව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 25 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 – 805/2

---

මගේ අංකය : IR/COM/03/2015/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 146, කෝට්ටේ පාර, පිටකෝට්ටේ. (සේවකයින් 20 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මහනුවර, හෙද පුහුණු විදුහල, විදුහල්පති නිල නිවාස, එල්. ආර්. සුමතිපාල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2016/158.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජාතික සේවක සංගමය, අංක 146, කෝට්ටේ පාර, පිටකෝට්ටේ. (සේවකයින් 20 දෙනෙකු වෙනුවෙන්)

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා සෝල්ට් ලිමිටඩ්, මහලේවාය, හම්බන්තොට.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

"ලංකා සෝල්ට් ලිමිටඩ් හි සේවය කරන පහත නම් සඳහන් සේවකයින් 20 දෙනාට වයස අවුරුදු 60 දක්වා සේවා දිගුව ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමි සහනයක් කවරේද යන්නත් පිළිබඳව වේ."

01. ඩබ්ලිව්. ජී. සුතසෝම
02. එච්. සුනිල්
03. සිසිර නානායක්කාර
04. ඒ. ජී. ධර්මසිරි
05. කේ. සිසිල් කුමාරි කුලතුංග
06. ජී. එම්. මුනිදාස
07. ඩබ්. ජී. ඩයස්
08. වී. රාජේෂ්වරී
09. ආර්. ඒ. ජී. ධර්මසිරි
10. ඊ. ගුණරත්න
11. හේවා කංකානම්ගේ දයාරත්න
12. ඒ. ප්‍රේමදාස
13. අයි. කේ. සෝමපාල
14. වී. ජී. ලීලානන්ද
15. ඕ. එච්. සිරිපාල
16. අබේසිංහ මද්දුමපටබැඳිගේ ගාමිණී
17. අජිත් නානායක්කාර
18. ඩබ්. ජී. නිමල්
19. ටී. ඩබ්ලිව්. කේ. චින්තා
20. එම්. ඒ. සරත්

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 22 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 – 806

---

මගේ අංකය : IR/COM/03/2017/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව -

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. ඩී. එස්. අලහකෝන් මිය, අංක 65/ඒ, ජම්බුගහවත්ත මාවත, පාලගම, පොල්ගස්ඕවිට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2018 ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2017/188.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඒ. එම්. ඩී. එස්. අලහකෝන් මිය, අංක 65/ඒ, ජම්බුගස්වත්ත මාවත, පාලගම, පොල්ගස්ඕවිට.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, අංක 234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ S - II ශ්‍රේණියේ යතුරු ලේඛිකාවක ලෙස සේවය කරන ඒ. එම්. ඩී. එස්. අලහකෝන් මහත්මියට 2015.04.07 දිනැතිව ලබා දෙන ලද චෝදනා පත්‍රය හා 2016.01.14 වැනි දිනැති සංශෝධිත චෝදනා පත්‍රය පදනම් කර ගනිමින් පවත්වන ලද විනය පරීක්ෂණය නිවැරදි හා සාධාරණ ද, එම විනය පරීක්ෂණය ප්‍රකාරව ලබා දෙන ලද විනය නියෝගය යුක්තිසහගත වන්නේ ද? එසේ නොවේ නම් ඇය වෙත ලැබිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ."

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2018 ජූලි මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

08 - 807

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.